# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1985 අංක 16 දරන
# දේශීය ආදයම් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1985 අප්‍රේල් මස 25 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1985 අප්‍රේල් මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : රු. 2.40 යි    තැපැල් ගාස්තුව : ශත 90 යි

# 1985 අංක 16 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1985 අප්‍රේල් මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 70/84

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1985 අංක 16 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1979 අංක 28 දරන පනතේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.**

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදයේ (xliii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(xliv) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය;

(xlv) 1985 අංක 2 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල පනතින් පිහිටුවන ලද බලශක්ති සංරක්ෂණ අරමුදල;

(xlvi) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනතින් පිහිටුවන ලද කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය;

(xlvii) 1968 අංක 11 දරන මුදල් පනත යටතේ පිහිටුවන ලද සමුපකාර සංවර්ධන අරමුදල;

(xlviii) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනතින් පිහිටුවන ලද මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (ඉ) ඡේදයේ "අවුරුදු හය" යන වචන වෙනුවට "අවුරුදු දහය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.**

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (ඇ) ඡේදයෙහි "වර්ෂයක් තුළ නම්," යන වචන වෙනුවට "වර්ෂයක් තුළ නම්;"; යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ වගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(ඈ) 1985 අප්‍රේල් මස 01 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් පුද්ගලයකුට ලැබුණු දල ලාභාංශවල එකතුව වෙන් රුපියල් දොළොස් දහසක් නොඉක්මවන ඒ පුද්ගලයාගේ ආදායමේ ඒ කොටස;".

2—ඒ 082827—10,250 (85/05)

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (උ) ඡේදයේ "යම් යෝජනා ක්‍රමයක් යටතේ". යන වචන වෙනුවට "යම් යෝජනා ක්‍රමයක් යටතේ ;"; යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තිය අගට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ඌ) යන්ත්‍ර නවීකරණය සඳහා 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද පොල් සංවර්ධන අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන පොල් සංවර්ධන අරමුදලින්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ ඡේදයේ (ii) අනුඡේදයේ "අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද" යන වචන වෙනුවට "අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ ඡේදයේ (ii) අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iii) නැව් අලුත්වැඩියා කිරීම, නැව් කැඩීම, සමුද්‍රීය නැව් බඩු ඇතුරුම් බඳුන් අලුත්වැඩියා කිරීම හා නැවත සැපයීම, කොම්පියුටර් මෘදු භාණ්ඩ, කොම්පියුටර් වැඩ සටහන් සහ කොම්පියුටර් පද්ධති සැලසීම, කොම්පියුටර් දත්ත වාර්තාගත කිරීම යන සේවා වලට විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම සඳහා 1972 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු සංස්ථාගත කරන ලද යම් සමාගමක් විසින් 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව එහෙත් 1989 මාර්තු මස 31 වන දිනට පෙරාතුව ඒ සේවාවන් සැලසීම ආරම්භ කරනු ලබන්නේ නම් සහ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 20අ වගන්තියේ (ඇ) ඡේදයේ "සම්බන්ධයෙන් වන විට," යන වචන වෙනුවට "සම්බන්ධයෙන් වන විට, 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ උපවගන්තියේ (ජ) ඡේදයේ "තැනැත්තා විසින් දරන ලද වියදම්" යන වචන වෙනුවට "තැනැත්තා විසින් දරන ලද වියදම් ; සහ" ; යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපවගන්තියේ අවසානයට පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ට) ඒ තැනැත්තා විසින් කරගෙන යනු ලබන වෙළෙඳාම්, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව නතර කිරීම නිසා යම් සේවා නියුක්තයකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම මත ඒ සේවා නියුක්තයාට පාරිතෝෂිකයක් ගෙවීමේ දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම්.".

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "වාණිජ ගොඩනැගිලි කුලියට දීමේ" යන වචන වෙනුවට "වාණිජ කාර්ය සඳහා ස්ථාන කුලියට දීමේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ අතුරු වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) එහි (iv) වන අනුඡේදයේ "ගෙවනු ලැබිය යුතු ය ; තවද" යන යෙදුම ඉවත් කොට ඒ වෙනුවට "ගෙවනු ලැබිය යුතු ය" ; යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (v) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ;

"(v) 1984 නොවැම්බර් මස 14 වන දින හෝ ඉන් පෙර ඇති කරන ලද වාර්ෂිකයක් වශයෙන් අවුරුදු හයක් නොඉක්මවන කාලයක් සඳහා ඔහු විසින් යම් මුදලක් ගෙවිය යුතු වන අවස්ථාවක, ඒ වාර්ෂිකය, වටිනා සහ ප්‍රමාණවත් ප්‍රතිෂ්ඨාවක් සඳහා හෝ ඒ වාර්ෂිකය ලබන්නාගේ ජීවිතාන්තය දක්වා වූයේ නම් මිස, ඒ වාර්ෂිකය ඇති කරනු ලැබූවේ යම් තක්සේරු වර්ෂයකදී ද ඒ තක්සේරු වර්ෂය තුළ සහ ඒ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් තුළ ඔහු විසින් ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය ; තව ද

(vi) 1984 නොවැම්බර් මස 15 වන දින හෝ ඉන් පසුව ඇති කරන ලද වාර්ෂිකයක් වශයෙන් ඔහු විසින් යම් මුදලක් ගෙවිය යුතුවන අවස්ථාවක, ඒ වාර්ෂිකය—

(අ) දික්කසාද දීමනාව හෝ නඩත්තු ගෙවීම වශයෙන් අධිකරණයේ ආඥාවක් යටතේ ගෙවනු ලබන්නේ නම්;

(ආ) යථා පරිදි ලියා අත්සන් කරන ලද වෙන්වීමේ ඔප්පුවක් යටතේ ඔහුගේ කලත්‍රයාට ගෙවනු ලබන්නේ නම්; හෝ

(ඇ) මුදලින් හෝ මුදලේ වටිනාකමෙහි සම්පූර්ණ ප්‍රතිෂ්ඨාව වෙනුවෙන් ගෙවනුලබන්නේ නම්

මිස, ඒ වාර්ෂිකය ඇති කරනු ලැබුවේ යම් තක්සේරු වර්ෂයකදී ද ඒ තක්සේරු වර්ෂය තුළ සහ ඒ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන යම් තක්සේරු වර්ෂයක් තුළ ඔහු විසින් ගෙවිය යුතු යම් මුදලක් සම්බන්ධයෙන් කිසිම අඩු කිරීමකට ඉඩ දෙනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ—

(අ) (අඅ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(අඅ) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් දහඅට දහසක දීමනාවක්;"; සහ

(ආ) ඒ උපවගන්තියේ (අඅ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:—

"(අඅඅ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් විසිහතර දහසක දීමනාවක් සහ"; තවද

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියෙහි—

(අ) (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්:—

"(ඇ) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් රුපියල් දහඅට දහසක දීමනාවක්; සහ

(ආ) (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ඇ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් රුපියල් විසිහතර දහසක දීමනාවක්.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "(5) වන උප වගන්තියේ" යන යෙදුම වෙනුවට "(5) වන උපවගන් තියේ සහ (5අ) උපවගන්තියේ" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ඔ) ඡේදයේ (vii) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(viii) 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට.";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ච) ඡේදයෙහි "පුද්ගලයකු" යන වචනය වෙනුවට "වාසික පුද්ගල යකු" යන වචන ආදේශ කිරීමෙන් ;" සහ "අවුරුදු විසිපහකට අඩු" යන වචන වෙනුවට "අවුරුදු තිහකට අඩු විවාහක හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(5) යම් තැනැත්තකු විසින් යම් තක්සේරු වර්ෂයක දී කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන, (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් ගෙවීම් නොවන සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන්—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා සමාගමක් නොවන යම් තැනැත්ත කුගේ, සහ

(ආ) 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා යම් සමාගමක

තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම, ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එක් පංගුවක් නොඉක්මවිය යුතු ය.";

(5) (5) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(5අ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් නොවන යම් තැනැත්තකුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීම—

(i) ඒ තක්සේරු වර්ෂයේ දී ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් ගෙවීම් නොවන සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් ඒ තක්සේරු කළ හැකි ආදායමෙන් තුනෙන් එක් පංගුවක් හෝ රුපියල් පන් ලක්ෂයක් යන මේ ප්‍රමාණ දෙකෙන් වඩා අඩු මුදල නොඉක්මවිය යුතු ය;

(ii) ඔහු විසින් කරන ලද හෝ කරන ලදැයි සලකනු ලබන (2) වන උපවගන්තියේ (ඇ), (ක) සහ (ග) ඡේදවල සඳහන් සුදුසුකම් ලබන සියලු ගෙවීම් සම්බන්ධයෙන් රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවිය යුතු ය;

(iii) (i) වන සහ (ii) වන අනුඡේදවල සඳහන් සුදුසුකම් ලබන ගෙවීම්වල එකතුව සම්බන්ධයෙන් රුපියල් පන් ලක්ෂයක් නොඉක්මවිය යුතු ය.".

(6) ඒ වගන්තියේ (7) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(7අ) යම් සමාගමක කොටස් කිසිවක් මිලට ගැනීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ දීමනාවක් තම තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කර ගැනීමට හිමිකම ඇති යම් තැනැත්තකු විසින්, ඒ කොටස් විකුණා ඇත්තා වූ සහ ඒ විකිණීමේ දින සිට මාස තුනක් ඇතුළත ඒ උපවගන්තිය යටතේ ඔහුගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කිරීමකට ඔහුට හිමිකම ඇති වෙනත් සාමාන්‍ය කොටස් මිළට ගෙන ඇත්තා වූ අවස්ථාවක, දෙවනුව සඳහන් කොටස් මිලට ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔහුට හිමිකම ඇති ආදායම් බද්දෙන් අඩු කිරීම, පළමුව

සඳහන් කොටස් මිලට ගැනීමේ ප්‍රතිඵලය වශයෙන් ඔහුට හිමිකම ලැබුණු ආදායම් බද්දෙන් අඩු කිරීමේ මුදල් ප්‍රමාණයෙන් අඩු කරනු ලැබිය යුතු ය. ";

(7) ඒ වගන්තියේ (8) වන උපවගන්තියේ "(ඇ) ඡේදයෙහි" යන වචන වෙනුවට "(ඇ) සහ (ක) ඡේදවල" යන වචන ආදේශ කිරීමෙන් ; තවද ;

(8) ඒ වගන්තියේ (9) වන උපවගන්තියේ (අ) ඡේදයේ (1) වන අනුඡේදයේ (ඉ) විෂයය (ඊ) විෂයය වශයෙන් නැවත අක්ෂර යෙදීමෙන් සහ නැවත අක්ෂර යොදන ලද විෂයට පෙරාතුවම පහත දැක්වෙන විෂයය ඇතුළත් කිරීමෙන් :—

"(ඉ) (i) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අධික සේවා නියුක්තියක් ඇති ප්‍රදේශයක් වශයෙන් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන ප්‍රදේශයක ස්වකීය සෑදීම හෝ නිෂ්පාදනය ආරම්භ කරන ; සහ

(ii) තැනැත්තන් විසිපස් දෙනකුට වැඩි සංඛ්‍යාවක් සේවයෙහි නියුක්ත කරන

ව්‍යවසායක් වන බඩු හෝ වෙළෙඳ ද්‍රව්‍ය සෑදීම හෝ නිෂ්පාදනය සඳහා වූ කාර්මික ව්‍යවසායක් පවත්වා ගෙන යන්නා වූ ; හෝ.".

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) (අ) ඡේදයේ (iii) වන අනුඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් :—

"(iii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඅ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; ";

(ආ) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(iv) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උපලේඛනයේ IIඅ කොටසෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ; "; සහ

(ඇ) ඒ අතුරු වගන්තියේ (i) වන සහ (ii) වන අනුඡේද ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

"(i) 1980 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ තුන සම්බන්ධයෙන් රුපියල් දොළොස් දහසක් ;

(ii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් දහඅට දහසක් ; සහ

(iii) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් විසිහතර දහසක්.".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ii) වන අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේද ආදේශ කිරීමෙන් :—

"(ii) 1980 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිවම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ තුන සම්බන්ධයෙන් මේ පනතේ පළමුවන උප ලේඛනයේ II වන කොටසෙහි ; හෝ

(iii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් IIඅ කොටසෙහි ; හෝ

(iv) 1985 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් IIආ කොටසෙහි.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය සංශෝධනය කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදයේ "එම තක්සේරු වර්ෂයක් සඳහා බදු ගෙවිය යුතු ආදායමෙන් සියයට පහක අතිරේක මුදලකින් ; සහ" යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඒ වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන්, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමේ බදු අය කළ හැකි ආදායමෙන් අතිරේක සියයට පහකින් ; සහ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ "යම් තක්සේරු වර්ෂයක් තුළ" යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය තුළ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (5) වන උප වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— **ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(6) (4) වන උපවගන්තියේ සහ (5) වන උපවගන්තියේ කාර්යය සඳහා පුද්ගලයකුගේ තක්සේරු කළ හැකි ආදායමට 11 වන වගන්තියේ (ඇ) ඡේදය යටතේ ආදායම් බද්දෙන් නිදහස් ඔහුගේ ආදායමේ යම් කොටසක් ද ඇතුළත් වන ලෙස සලකනු ලැබිය යුතු ය.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— **ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම.**

"(1) "ශුද්ධ ධනය" යන්නෙන් මේ පරිච්ඡේදයේ විධිවිධාන වලට අනුකූලව අගණනය කරනු ලැබූ—

(අ) මුදලින් හෝ මුදල්වල වටිනාකමින් ප්‍රතිජ්ඥාවක් නොමැතිව හෝ අසම්පූර්ණ ප්‍රතිජ්ඥාවක් සඳහා හෝ ඇතිකර ගත් යම් ණයක් නොවන ;

(ආ) තමා විසින් ඇතිකර ගත් සම්පූර්ණයෙන් තමාගේ ම ප්‍රයෝජනය සඳහා නොවූ යම් ණයක් නොවන ;

(ඇ) වෙනත් යම් තැනැත්තකුගෙන් ප්‍රතිපූරණයක් ලබා ගත නොහැකි වන්නේ නම් මිස, ප්‍රතිපූරණයක් ලබා ගැනීමට තමාට අයිතිවාසිකමක් ඇති යම් ණයක් නොවන ;

(ඈ) යම් ණයවීමකින් ලබා ගන්නා ලද මුදලක්, ඔහුගේ ධනයට ඇතුළත් කරනු ලැබූ යම් දේපළක් මිළ දී ගැනීමට, වැඩි දියුණු කිරීමට හෝ නඩත්තු කිරීමට ඔහු විසින් උපයෝගී කරනු ලැබුවේ නම් මිස, මේ පරිච්ඡේදය යටතේ ධනයෙන් බැහැර කරනු ලැබූ යම් දේපළකට වැය බරක් වූ හෝ එවැනි දේපළක ඇපය පිට ඇතිකර ගත් හෝ ඒ දේපළ සම්බන්ධ යෙන් ඇතිකර ගත් යම් ණයක් නොවන ; සහ

(ඉ) ශ්‍රී ලංකාවේ දී ගෙවීමට ගිවිස ගත් හෝ ශ්‍රී ලංකාවේ දේපළකට වැය බරක් වූ හෝ එවැනි දේපළක ඇපය පිට ඇතිකර ගත් යම් ණයක් නොවන, ඔහු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත ඇති කරගත් යම් ණයක් නොවන

(i) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දින වූ යම් තැනැත්තකුගේ ධනයේ ; සහ

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ අවසාන දින වූ යම් තැනැත්තකුගේ ධනයේ

සමස්ත වටිනාකම ඒ දිනයෙහි දී ඔහු විසින් ගෙවිය යුතු සියලුම ණයවල සමස්ත වටිනාකම ඉක්මවන්නේ යම් ප්‍රමාණයකින් ද ඒ ප්‍රමාණය අදහස් වන අතර, එහිලා දේපළෙහි වෙන් වෙන් කොටස්වලට වැය බරක් වූ එකම ණය එක් වරකට වඩා ගණන් ගනු නොලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය සංශෝධනය කිරීම.

**18.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) නිර්වාසික සමාගමක් නොවන යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ධනය—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා රුපියල් දෙලක්ෂයක මුදලක් ඉක්මවන, ඒ තැනැත්තාගේ ශුද්ධ ධනයේ ඒ කොටස විය යුතු ය ; තව ද

(ආ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් පන්ලක්ෂයක මුදලක් ඉක්මවන ඒ තැනැත්තාගේ ශුද්ධ ධනයේ ඒ කොටස විය යුතු ය.

තව ද, ඒ බදු අය කළ හැකි ධනය සම්බන්ධයෙන් ධන බද්ද ගෙවීමට ඒ තැනැත්තා යටත් විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය සංශෝධනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්—

"(1) යම් නිශ්චල දේපළක වටිනාකම—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයේ පැවති එහි වෙළෙඳ අගය විය යුතු ය ; තවද

(ආ) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තක්සේරු වර්ෂයේ අවසාන දින පැවති එහි වෙළෙඳ අගය විය යුතු ය :

එසේ වුවද, (මේ උපවගන්තියෙහි "තක්සේරු කරනු ලබන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) තක්සේරු කරනු ලබන්නේ යම් තැනැත්තකුගේ ධනය ද ඒ තැනැත්තාගේ ඒ ධනයේ කොටසක් ලෙස ඒ දේපළ 1977 අප්‍රේල් මස 1 වන දින සංයුක්ත වන්නේ නම් හෝ 1977 අප්‍රේල් මස 1 වන දින ඒ දේපළ අයිතිව සිටි හෝ ඒ දේපළෙහි සම්බන්ධතාවක් දරනු ලැබූ වෙනත් තැනැත්තකු විසින් කරන ලද ත්‍යාගයකින් හෝ උරුමයෙන් ඒ දේපළ අත්කර ගනු ලැබූවේ නම්—

(i) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමුවන දින සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂයේ පළමුවන දින; සහ

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක අවසාන දින

ඒ දේපළෙහි වෙළෙඳ අගය වූ කලී, 1977 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ඒ දේපළ සම්බන්ධයෙන් කරන ලද යම් වැඩි දියුණු කිරීම්වල, එකතු කිරීම්වල හෝ වෙනස් කිරීම්වල වියදමට සමාන ප්‍රමාණයකින් වැඩි වූ 1977 අප්‍රේල් මස 1 වන දින එහි වෙළෙඳ අගය හෝ—

(අ) (i) වන අනුඡේදයේ සඳහන් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට ඒ තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස 1 වන දින; හෝ

(ආ) (ii) වන අනුඡේදයේ සඳහන් යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට ඒ තක්සේරු වර්ෂයේ මාර්තු 31 වන දින

එහි වෙළෙඳ අගය හෝ යන මේ දෙකෙන් කවර වූ අඩු වෙළෙඳ අගය එහි වෙළෙඳ අගය ලෙස සලකනු ලැබිය යුතුය. ".

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

" (අ) යම් චංචල දේපළක වෙළෙඳ අගය—

(i) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දින එහි වෙළෙඳ අගය විය යුතුය ; තවද

(ii) 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ඒ තක්සේරු වර්ෂයේ අවසාන දින එහි වෙළෙඳ අගය විය යුතු ය.";

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙහි සමාගමේ සම්පූර්ණ වත්කමේ වෙළෙඳ අගයෙන් පහත දැක්වෙන මිල ගණන් අඩු කොට," යන වචන වෙනුවට "1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ හතරෙන් එක් එක් තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ පළමුවන දිනයෙහි සහ 1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් ඒ තක්සේරු වර්ෂයේ අවසාන දිනයෙහි සමාගමේ සම්පූර්ණ වත්කමේ වෙළෙඳ අගයෙන් පහත දැක්වෙන මිල ගණන් අඩුකොට," යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන පුඥප්තියේ 56 වන වගන්තිය සංශෝධනය කිරීම.

**20.** ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ඒ තක්සේරු වර්ෂයේ අප්‍රේල් මස 1 වන දින ඒ කොටස් වල පැවති වටිනාකම" යන යෙදුම වෙනුවට, "ත්‍යාග කරන ලද දින ඒ කොටස්වල පැවති වටිනාකම" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම.

**21.** ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1අ) උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ උපවගන්තියේ (i) වන ඡේදයෙහි "රුපියල් දොළොස් දහසක්; සහ" යන වචන වෙනුවට "රුපියල් දොළොස් දහසක්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ii) වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන්;

"(ii) 1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා රුපියල් දහ අට දහසක්; සහ

(iii) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා රුපියල් විසි හතර දහසක්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ XII වන පරිච්ඡේදයේ "ඒ" උපශීර්ෂය සංශෝධනය කිරීම.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ XII වන පරිච්ඡේදයේ ඒ. උපශීර්ෂයේ "සංචාරක ව්‍යාපාර" යන වචන වෙනුවට "සංචාරක ව්‍යාපාර සහ අපනයන කටයුතු" යන වචන ආදේශ කිරීමෙන් ඒ උපශීර්ෂය මෙයින් සංශෝධනය කරනු ලැබේ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 85අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**23.** ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 85අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය :—

"අපනයන කටයුතුවල නිරත සමාගම්වල ඇතැම් ලාභ සහ ආදායම් වෙනුවෙන් ආදායම් බදු සහන.

85අ. 20(1) වන වගන්තියේ හෝ 20අ(1) වන වගන්තියේ සඳහන් ව්‍යවසායක අපනයන පිරිවැටුමෙන් සමාගමක ශුද්ධ විදේශ විනිමය ඉපැයුම, එකී වගන්තිවල විධිවිධාන යටතේ ඒ සමාගමේ ලාභය සහ ආදායම මුළුමනින් ම හෝ ඉන් කොටසක් හෝ ආදායම් බද්දෙන් නිදහස් වන වර්ෂයේ අවසන් දිනයෙන් ඉක්බිතිව ම එළඹෙන වර්ෂ දහයක කාල පරිච්ඡේදය තුළ එක් එක් වර්ෂයේ (නැව් ගාස්තු සහ රක්ෂණ ගාස්තු අයකිරීමට පෙර) ඒ අපනයනවල වටිනාකමින් සියයට හැත්තෑ පහක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් බවට අපනයන සංවර්ධන මණ්ඩලය විසින් සහතික කරනු ලබන අවස්ථාවක, ඉහත සඳහන් වර්ෂ දහයේ කාල පරිච්ඡේදයේ කවර හෝ වර්ෂයක් සඳහා වන අපනයන ලාභය සහ ආදායම සම්බන්ධයෙන් සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දෙන්, නිශ්චිත මුදලින් සියයට පනහකට සමාන මුදලක් අඩු කිරීමට ඒ සමාගමට හිමිකම තිබිය යුතු ය.

මේ වගන්තියේ කාර්ය සඳහා—

(අ) "අපනයන පිරිවැටුම" සහ "අපනයන ලාභ සහ ආදායම" යන්නෙහි 20 වන වගන්තියෙහි ඒවාට දී ඇති අර්ථ ම ඇත්තේ ය ;

(ආ) "නිශ්චිත මුදල" යන්න යම් තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් යෙදෙන විට—

(i) වාසික සමාගමක් සම්බන්ධයෙන් වන විට, 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ දෙනු ලැබූ යම් සහනයක් අඩු කිරීමෙන් පසු, 33 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දට, ඒ තක්සේරු වර්ෂය සඳහා, ඒ සමාගමේ අපනයන ලාභ සහ ආදායමත් ඒ සමාගමේ මුළු ලාභ හා ආදායමත් අතර ඇති අනුපාතයට සමාන අනුපාතයක් දරන මුදලක් ; සහ

(ii) නිර්වාසික නොවන සමාගමක් සම්බන්ධයෙන් වන විට, 82 වන වගන්තිය හෝ 83 වන වගන්තිය යටතේ දෙනු ලැබූ යම් සහනයක් අඩු කිරීමෙන් පසුව, 34 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්දට ඒ තක්සේරු වර්ෂය සඳහා, ඒ සමාගමේ අපනයන ලාභ හා ආදාය මත් ඒ සමාගමේ මුළු ලාභ සහ ආදායමත් අතර ඇති අනුපාතයට සමාන මුදලක්

ඉන් අදහස් වේ.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

**24.** ප්‍රධාන ප්‍රඥප්තියේ 92අ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 92අඅ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :—

" වාර්තාවල හා වෙනත් ලේඛනවල ජාතික හැඳුනුම්පත් අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය ඇතුළත් විය යුතු බව.

92අඅ. මේ පනතේ කාර්යය සඳහා 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත යටතේ ආදායම් බදු, ධන බදු හෝ ත්‍යාග බදු ගෙවීමට යටත් සෑම පුද්ගලයකු විසින් ම,—

(අ) ඒ තක්සේරු වර්ෂය සඳහා ඔහුගේ ආදායම, ධනය හෝ ත්‍යාග පිළිබඳ වාර්තා වෙහි—

(i) ඔහු 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් තැනැත්තකු නම්, ඔහුගේ හැඳුනුම්පත් අංකය ; හෝ

(ii) ඔහු, ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් නොවන්නේ නම්, ඔහුගේ පවත්නා විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය

දැක්විය යුතු ය ;

(ආ) මේ පනතේ විධිවිධාන සාධාරණීය ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිලිමත්ව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක්

මගින් අමාත්‍යවරයා විසින් සඳහන් කරනු ලබන යම් ගණුදෙනුවකට අදාළ ලේඛනවල—

(i) ඔහු ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් තැනැත්තකු නම් ඔහුගේ හැඳුනුම්පත් අංකය ; හෝ

(ii) ඔහු ඉහත කී පනත යටතේ ලියාපදිංචි කිරීමට යටත් නොවන්නේ නම් ඔහුගේ පවත්නා විදේශ ගමන් බලපත්‍රයෙහි අංකය

දැක්විය යුතු ය. ".

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 97 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (3) මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සහ (2) වන උපවගන්තියෙහි කුමක් සඳහන්ව ඇත ද, 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී ශ්‍රී ලංකාවේ වාසික යම් සමාගමක් විසින් බෙදා හරිනු ලැබූ ලාභාංශ සම්බන්ධයෙන් 33(1)(ආ) වගන්තිය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු සම්පූර්ණ බද්ද, ඒ ලාභාංශ බෙදීමේ දිනයට පසුව එළඹෙන 30 වන දින හෝ එදිනට පෙර ගෙවිය යුතු ය. ".

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ ;— ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (1අ) 97 වන වගන්තියේ (3) වන උපවගන්තියේ සඳහන් දිනයෙහි හෝ එදිනට පෙර සමාගමක් විසින් ගෙවිය යුතු සම්පූර්ණ බද්ද හෝ ඒ බද්දෙන් කොටසක් හෝ එසේ ගෙවා නොමැති අවස්ථාවක, ඒ බද්ද හෝ එහි කොටස පැහැර හරිනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර මේ පනතේ කාර්යය සඳහා ඒ සමාගම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය. " ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු වගන්තියේ (ii) ඡේදයේ " දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය " ; යන වචන වෙනුවට " දණ්ඩන මුදලක් ගෙවීමට යටත් නොවිය යුතු ය.

මේ ඡේදයේ කාර්යය සඳහා, 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක් සම්බන්ධයෙන් වන විට ආදායම් බද්දට ඒ තක්සේරු වර්ෂයේ දී 33 වන වගන්තියේ (1)

වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු බදු ඇතුළත් නොවිය යුතු ය."; යන කොටස ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන පුඥප්තියේ 131 වන වගන්තිය සංශෝධනය කිරීම.

27. ප්‍රධාන පුඥප්තියේ 131 වන වගන්තියේ (1) වන උප වගන්තිය අගට පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1අ) (මේ වගන්තියේ "හවුල් ගිණුම් ධාරක හෝ ධාරකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) පැහැර හරින්නා සහ වෙනත් යම් තැනැත්තකු හෝ තැනැත්තන් සඳහා හා වෙනුවෙන් එක්ව, යම් තැනැත්තකු මුදල් දරන අවස්ථාවක, පැහැර හරින්නා විසින් දායක වූ මුදල්වලට ආරෝපණය කරනු ලැබිය යුතු බවට කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්ව ඇත්තා වූ සහ කොමසාරිස් ජනරාල්වරයා විසින් එලෙස සහතික කරනු ලැබ ඇත්තා වූ හවුල් ගිණුමෙහි ඇති මුදල්වලින් හෝ ඒ මුදල්වල ඒ කොටසින් දැන්වීමේ නම් කරන ලද නිලධරයාට පැහැර හැර ඇති බද්දේ මුදල හෝ එකී කොටස හෝ ගෙවන ලෙස නියම කරමින් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් දෙනු ලැබිය හැකි ය:

එසේ වුවද—

(අ) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීම අනුව ක්‍රියා කිරීමෙහි ලා මුදල් ප්‍රේෂණය කරන සෑම තැනැත්තකු ම, ඒ සිද්ධිය පිළිබඳව වෙනත් සෑම හවුල් ගිණුම් ධාරකයකුට ම දැනුම් දිය යුතු ය;

(ආ) පැහැර හරින්නා හැර වෙනත් සෑම හවුල් ගිණුම් ධාරකයකු විසින්, (අ) ඡේදය යටතේ දැනුම්දීමක් තමා වෙත ලැබුණු දින සිට සති දෙකක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද දැන්වීමේ දිනට ඒ හවුල් ගිණුමෙහි ශේෂයට ඔහුගේ ශුද්ධ දායක මුදල නියෝජනය කෙරෙන යම් ප්‍රේෂණයක කොටස් සම්බන්ධයෙන් කොමසාරිස් ජනරාල්වරයා වෙත හිමිකම් පෑමක් කරනු ලැබිය හැකි අතර කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ හිමිකම් පෑම සැලකිල්ලට භාජනය කොට ඒ පිළිබඳව තම නියමය කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ කරන ලද කොමසාරිස් ජනරාල්වරයාගේ නියමයකින් අතෘප්තියට පත් සෑම හවුල් ගිණුම් ධාරකයකු ම, ඔහු විසින් කරන ලද දායකවීම් වලට ආරෝපණය කරනු ලැබිය හැකි බවට ඔහු හිමිකම් පා සිටින යම් මුදලක් හෝ ඒ මුදලේ කොටස හෝ අය කර ගැනීම සඳහා ආඥාවක් ඉල්ලමින් දිසා අධිකරණයෙහි නඩු පවරනු ලැබිය හැකි ය.

(68 වන අධිකාරය වූ) කාලාපගමන ආඥාපනතේ යම් විධිවිධානයක කුමක් සඳහන්ව ඇතද, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඔහුට නිකුත් කරන ලද දැන්වීමේ දින සිට මාස තුනක් ඉකුත් වීමෙන් පසු ඒ මුදල හෝ ඒ

මුදලේ කොටස හෝ අයකර ගැනීම සඳහා කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.".

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 149 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(6) 35 වන වගන්තියේ සහ 38 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් ව ඇතද, ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ කොටස් හිමියා වාසිකයකු වන රටේ ආණ්ඩුව අතර 82 වන වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් ගිවිසුමක නිශ්චිත ලාභාංශ මත වූ බදු අනුප්‍රමාණය ඉක්මවමින් වාසික සමාගමක් විසින් නිර්වාසික කොටස් හිමියකුට ගෙවන ලද ලාභාංශයක් සම්බන්ධයෙන් 38 වන වගන්තියට අනුකූලව අඩු කරන ලද යම් බද්දක්, ඒ බද්ද අඩු කරනු ලැබුවේ යම් වර්ෂයක දී ද ඒ වර්ෂයේ අවසානයේ සිට අවුරුදු තුනක් ඇතුළත නැතහොත් ඒ ගිවිසුම බලාත්මක වූයේ යම් දිනයක දී ද ඒ දින සිට එක් වර්ෂයක් ඇතුළත යන මේ දෙකින් පසුව එළඹෙන කාලය ඇතුළත යථා පරිදි ලියවිල්ලකින් කරන ලද හිමිකම් පෑමක් මත ඒ කොටස් හිමියාට ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (ඈ) ඡේදයේ "92 වන වගන්තියේ (1) වන උප වගන්තියේ හෝ 127 වන වගන්තියේ (2) වන උපවගන්තියේ" යන යෙදුම වෙනුවට "92 වන වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ 92අ වගන්තියේ හෝ 127 වන වගන්තියේ (2) වන උප වගන්තියේ" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තිය සංශෝධනය කිරීම.

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 158 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 158අ වගන්තිය වශයෙන් බලපැවැත් විය යුතු ය :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 158අ වගන්තිය ඇතුළත් කිරීම.

"දේශීය ආදායම් දිරිගැන්වීමේ අරමුදල.

158අ. (1) (මේ වගන්තියේ මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) දේශීය ආදායම් දිරි ගැන්වීමේ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) 1985 ජනවාරි මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එක් එක් වර්ෂය වෙනුවෙන් අරමුදලේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන යම් මුදල් අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) (අ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්ත

මේන්තුවේ නිලධරයන්ගේ සුභ සාධනය සඳහා අවශ්‍ය සියලු මුදල් ; සහ

(ආ) කොමසාරිස් ජනරාල් වරයා විසින් ක්‍රියාත්මක කරනු ලබන යම් පනතක් ක්‍රියාත්මක කිරීමෙහි ලා කාර්යක්ෂමතාවය සහතික කරනු පිණිස අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් පංතියකට හෝ වර්ගයකට අයත් නිලධරයන්ට සමූහ දිරි ගැන්වීමේ දීමනා

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ තත්කාර්ය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය දෙනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් හෝ නියමිත කාර්ය පරිපාටිය අනුකූලව අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය සංශෝධනය කිරීම.

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "බලය ලත් නියෝජිතයා" යන්නෙහි අර්ථ කථනයේ (2) වන ඡේදයෙහි "සමාගම් (විගණන) නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කරනු ලැබූ පුද්ගලයකුට කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද" යන වචන වෙනුවට "තත් කාර්යය සඳහා සාදන ලද නියෝග යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවා වූ ද" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "ව්‍යාපාර" යන්නෙහි අර්ථකථනයේ "සමාගමක් විසින් වාණිජමය ස්ථාන කුලියට දීම ඇතුලත් වේ"; යන වචන වෙනුවට "සමාගමක් විසින් වාණිජමය කාර්ය සඳහා ස්ථාන කුලියට දීම ඇතුලත් වේ ;" යන වචන ආදේශ කිරීමෙන්.".

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

32. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ උපලේඛනයේ IIඅ කොටසේ "1984 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා" යන යෙදුම වෙනුවට "1984 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා" යන යෙදුම ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ උපලේඛනයේ II අ කොටසට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන් :—

"II ආ කොටස

1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු අනුප්‍රමාණ පහත දැක්වෙන පරිදි විය යුතු ය :—

| | | |
|---|---|---|
| බදු අයකළ හැකි ආදායමෙහි පළමුවන රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 7½ |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 10 |
| බදු අය කළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 15 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 20 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 25 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 30 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 35 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 9,000 සම්බන්ධයෙන් | ... | සියයට 40 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 15,000 සම්බන්ධයෙන් | ... | සියයට 45 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඊළඟ රු. 15,000 සම්බන්ධයෙන් | ... | සියයට 50 |
| බදු අයකළ හැකි ආදායමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් | ... | සියයට 55". |

(ඇ) උපලේඛනයේ IV වන කොටස ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"IV වන කොටස

32 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි සඳහන් සේවා නියුක්තියෙන් ලබන ඇතැම් ලාභවලට අදාළ විය යුතු ආදායම් බද්දෙහි අනුප්‍රමාණ—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ පහ සඳහා—

| | | | |
|---|---|---|---|
| පළමුවන රු. 50,000 සම්බන්ධයෙන් | ... | ... | කිසිවක් නැත |
| ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් | ... | ... | සියයට 05 |
| ඊළඟ රු. 25,000 සම්බන්ධයෙන් | ... | ... | සියයට 10 |
| ඉතිරි කොටස සම්බන්ධයෙන් | ... | ... | සියයට 15 |

(ආ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

| | | | |
|---|---|---|---|
| පළමුවන රු. 1,00,000 සම්බන්ධයෙන් | ... | ... | කිසිවක් නැත |
| ඊළඟ රු. 50,000 සම්බන්ධයෙන් | ... | ... | සියයට 05 |
| ඊළඟ රු. 50,000 සම්බන්ධයෙන් | ... | ... | සියයට 10 |
| ඉතිරි කොටස සම්බන්ධයෙන් | ... | ... | සියයට 15 ". |

ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**33.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනයේ (3) වන විෂය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(3) (අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් නොවන) පොල්මෑකරුවන් සහ (ඇවරකරුවන් නොවන) දේපළ භාරගන්නෝ—(අන්තිම කැමති පත්‍ර යටතේ භාරකරුවන් නොවන) පොල්මෑකරුවන්ගේ සහ (ඇවරකරුවන් නොවන) දේපළ භාර ගන්නන්ගේ බදු අය කළ හැකි ආදායම—

(i) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් වර්ෂය සඳහා ... සියයට 30

(ii) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එළඹෙන යම් තක්සේරු වර්ෂයක් සඳහා ... ... ... සියයට 40.".

ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනය සංශෝධනය කිරීම.

**34.** ප්‍රධාන ප්‍රඥප්තියේ හතරවන උපලේඛනයේ (1) වන විෂයය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන විෂයය ආදේශ කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) පුණ්‍යායතනයක් හෝ ශ්‍රී ලංකාවේ නිශ්චල දේපළ ඇති නිර්වාසික සමාගමක් හෝ නොවන යම් තැනැත්තකු සම්බන්ධයෙන් වූ විට—

(අ) 1979 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන ඊළඟ තක්සේරු වර්ෂ පස සඳහා—

| | | |
|---|---|---|
| බදු අය කළ හැකි ධනයෙන් පළමුවන රු. 2,00,000 සම්බන්ධයෙන් | සියයට | 1/2 |
| බදු අය කළ හැකි ධනයෙන් ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... | සියයට | 3/4 |
| බදු අය කළ හැකි ධනයෙන් ඊළඟ රු. 10,00,000 සම්බන්ධයෙන් ... | සියයට | 1 |
| බදු අය කළ හැකි සියලු ධනයෙන් ඉතිරි කොටස සම්බන්ධයෙන් ... | සියයට | 2 |

(ආ) 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා—

| | | |
|---|---|---|
| බදු අය කළ හැකි ධනයෙන් පළමුවන රු. 5,00,000 සම්බන්ධයෙන් | සියයට | 1/2 |
| බදු අය කළ හැකි ධනයෙන් ඊළඟ රු. 10,00,000 සම්බන්ධයෙන් ... | සියයට | 3/4 |
| බදු අය කළ හැකි ධනයෙන් ඊළඟ රු. 15,00,000 සම්බන්ධයෙන් ... | සියයට | 1 |
| බදු අය කළ හැකි සියලු ධනයෙන් ඉතිරි කොටස සම්බන්ධයෙන් ... | සියයට | 2.". |

ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය සංශෝධනය කිරීම.

**35.** ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ :—

## “V වන උපලේඛනය

(51 වන වගන්තිය)

### ත්‍යාග බද්දෙහි අනු ප්‍රමාණය

**1අ. 1979 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන තක්සේරු වර්ෂය සහ ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ පහෙන් එක් එක් තක්සේරු වර්ෂය සඳහා පුද්ගලයන් සම්බන්ධයෙන් වන විට :—**

| | |
|---|---|
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි පළමුවන රු. 50,000 සම්බන්ධයෙන් ... ... ... | කිසිවක් නැත |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 5 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 10 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 15 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 20 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 1,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 25 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 30 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 35 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 40 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 45 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 50 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 55 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 60 |

බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් සියයට 70.

**1 ආ. 1985 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා පුද්ගලයන් සම්බන්ධයෙන් වන විට :—**

| | |
|---|---|
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි පළමු වන රු. 2,50,000 සම්බන්ධයෙන් ... ... ... | කිසිවක් නැත |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 5 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 10 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 15 |

| | |
|---|---|
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 20 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 2,50,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 25 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 30 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 35 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 40 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඊළඟ රු. 5,00,000 සම්බන්ධයෙන් ... ... ... | සියයට 45 |
| බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමෙහි ඉතිරි කොටස සම්බන්ධයෙන් ... ... | සියයට 50 |

2. සමාගම් සම්බන්ධයෙන් වන විට—

බදු අය කළ හැකි සියලුම ත්‍යාගවල වටිනාකමින් සියයට 50

2 වන වගන්තියේ මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව සම්බන්ධයෙන් වූ සංශෝධනය අතීතයට බලපෑ යුතු බව.

36. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන මහා කොළඹ ආර්ථික කොමිෂන් සභා පනත යටතේ පිහිටුවන ලද මහා කොළඹ ආර්ථික කොමිෂන් සභාව නිදහස් කරමින් මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියට කරන ලද සංශෝධනය, ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මක වූ දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතුය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.